සේවක අර්ථසාධක අරමුදල	22,645.44	22,465
සේවක භාරකාර අරමුදල	5,661.36	5,618
විදුලිය	9,561.50	15,028
ක්ෂයවීම්	1,445.00	1,445
ප්‍රායෝගික වියදම්	-	3,600
දුරකථන	10,736.44	8,139
අපහායනය සඳහා වෙන් කිරීම්	16,450.00	165,000
පාරිතෝෂික වෙන් කිරීම්	8,523.00	8,403
	451,334.74	552,070
වියදමට වැඩි ආදායම / (ආදායමට වැඩි වියදම)	**8,665.26**	**26,430**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2015	2014
	රු.	රු.

12 පාඨමාලා ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් මත සෘජු වියදම්

කාර්ය මණ්ඩල වැටුප්,ප්‍රසාද දීමනා හා අතිකාල දීමනා	2,161,000.55	1,891,369
සේවක අර්ථසාධක අරමුදල	174,671.88	168,993
සේවක භාරකාර අරමුදල	43,667.81	42,248
දේශන ගාස්තු හා ඒකාබද්ධ අරමුදලට ගෙවීම්	1,515,166.50	1,716,517
ප්‍රායෝගික ගාස්තු හා ඒකාබද්ධ අරමුදලට ගෙවීම්	1,496,757.50	1,405,404
ගරු දීමනා හා ඒකාබද්ධ අරමුදලට ගෙවීම්	170,248.53	141,067
නඩත්තු ගාස්තු	30,000.00	30,000
තොරතුරු තාක්ෂණ උපකරණ නඩත්තු	36,000.00	44,000
සම්මන්ත්‍රණ වියදම්	216,850.00	205,389
ඡායා පිටපත් වියදම්	192,455.79	201,091
ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අමුද්‍රව්‍ය	23,435.00	30,312
ලිපිද්‍රව්‍ය හා මුද්දර	138,446.79	173,845
කුළී, විදුලිය හා ජලය	792,700.00	289,950
සම්මාන උත්සව වියදම්	-	914,282
පුහුණු වැඩ සටහන් වියදම්	10,180.00	32,761
දේශනා ගාස්තු - කොළඹ විශ්ව විද්‍යාලය	1,900,000.00	-
NVQ තත්වකරණ රැස්වීම් සඳහා	2,000.00	6,300
	8,903,580.35	**7,293,529**

13 අනෙකුත් ආදායම

ගිය වසරේ වැටුප් වැඩිපුර ගෙවීම් නැවත අයකර ගැනීම	25,296.00	17,968
විවිධ ආදායම්	17,550.00	17,000
NVQ තත්වකරණ සඳහා රැස්වීම් වියදම් ලබාදීම්	-	598,107
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය	123,412.31	-
	166,258.31	**633,075**

14 සේවක වියදම්

	2,427,454.55	2,323,159
කාර්ය මණ්ඩල වැටුප්, ප්‍රසාද දීමනා, අතිකාල හා දීමනා	180,876.00	177,759
සේවක අර්ථසාධක අරමුදල	45,219.00	44,451
සේවක භාරකාර අරමුදල	111,550.00	98,500
කම්කරු වියදම් හා කාර්යාල කාර්ය සහායක දීමනා	92,229.50	98,112
සුභසාධන වියදම්	33,500.00	107,200
කාර්ය මණ්ඩල පුහුණු කටයුතු සඳහා	83,417.25	71,886
පාරිතෝෂික වෙන්කිරීම්		
	2,974,246.30	**2,921,067**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2015	2014
	රු.	රු.

15 අනෙකුත් මෙහෙයුම් වියදම්

සභාපතිට දීමනා	67,500.00	90,000
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීමේ දීමනා	5,000.00	37,000
අධ්‍යයන කටයුතු සඳහා පැමිණීමේ වියදම්	9,000.00	-
තත්ව සහතික සඳහා වියදම	168,320.00	-
ගමන් ගාස්තු	14,220.00	22,815
ගමන් ගාස්තු - අලෙවි කළමනාකරුවන් සඳහා	72,000.00	72,000
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම	2,320.00	14,583
යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා සහ නඩත්තු වියදම්	855,954.30	261,741
ආයතනයේ විෂයමාලා සංවර්ධනය කිරීමේ වැඩසටහන්	-	45,000
දුරකථන	154,013.68	138,642
අන්තර්ජාල සේවා ගාස්තු	5,448.76	6,122
ගිණුම්කරණ වියදම්	169,928.60	127,898
විගණන ගාස්තු	125,000.00	125,000
රක්ෂණ වියදම්	4,364.61	4,243
ප්‍රචාරක වියදම්	383,372.64	609,364
පාඨමාලා ප්‍රවර්ධනය කිරීමේ වියදම්	5,250.00	-
අපහායනය සඳහා වෙන් කිරීම්	1,075,574.50	636,400
පරිපාලන හා මූල්‍ය නිති සකස් කිරීමේ වියදම්	-	56,725
බැංකු ගාස්තු	3,003.73	34,288
ඇමතිතුමා පැමිණීමේ වියදම්	29,000.00	-
වාර්ෂික වාර්තාව සඳහා	-	43,484
ප්‍රදර්ශන සඳහා වියදම්	34,760.00	131,708
පරිවර්තන ගාස්තු	9,325.00	29,787
වෙබ් අඩවියක් ආරම්භ කිරීමේ ගාස්තු	6,195.67	6,196
වත්කම් විකිණීම මත වූ අලාභය	-	193,000
අනුග්‍රහක වියදම්	-	10,000
විවිධ වියදම්	8,529.25	12,321
කපා හරින ලද ගොඩනැගිලි අත්තිකාරම් වියදම්	227,370.25	-
සේ.නි.භ.අ. අධිභාරය	2,671.13	-
	3,438,122.12	**2,708,318**

16 ශුද්ධ මූල්‍ය ආදායම්

පොළී ආදායම	3,854,936.13	4,596,391
සේවක ණය පොළී ලැබීම්	26,701.39	20,460
	3,881,637.52	**4,616,851**

විගණකාධිපති වර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } විවිවයි/ඊ/එස්එල්අයිඕපී/01/15/81 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2016 සැප්තැම්බර් 30 දින

සභාපති

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතේ 25(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2 මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනත අනුව රජයේ මුද්‍රණාලයාධිපතිවරයා නිල බලයෙන් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාලක මණ්ඩලයට පත්වන අතර පාලක මණ්ඩලයේ එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් පත් කිරීමට බලය ලබාදී ඇත. කෙසේ වුවද රජයේ මුද්‍රණාලයාධිපතිවරයා එහි අරම්භයේ සිටම ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ සභාපතිවරයා ලෙස පත් කර තිබුණි. විධිමත් ගිවිසුමක් නොමැතිව හා කිසිදු ගෙවීමකින් තොරව ආයතනය පවත්වාගෙන යාමට අවශ්‍ය ඉඩ පහසුකම්, විදුලිය හා ජලය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා අතර ගාස්තු අය කිරීමකින් තොරව දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු කිරීම ආයතනය විසින් කරනු ලැබේ.

2.2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ප්‍රමිතයෙහි 17 කොටස අනුව 2013 සැප්තැම්බර් 18 දින තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් ආයතනයට පවරා දී තිබූ හෙක්ටයාර් 0.1012 (පර්චස් 40ක් පමණ) ඉඩමේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. මෙම ඉඩම හා රජයේ මුද්‍රණාලය පිහිටා ඇති සම්පූර්ණ ඉඩම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරා ගෙන ඇති බැවින් මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් ලෙස දක්වා නොමැති බව සභාපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

ණයගැති හානිකරණය සඳහා වෙන්කිරීම, ණය අයනොවීමේ සම්භාවිතාවය මත සිදුවිය යුතු වුවත්, ඊට අදාල ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මගින් හෙලිදරව් කර නොතිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රකාශන තුළ ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි මුළු ණයගැති ශේෂය සඳහාම ණයගැති හානිකරණය සඳහා වෙන්කර තිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු.4,612,100 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු.7,039,574 ක් වුයෙන් ණයගැති ශේෂය සියයට 52 කින් වර්ධනය වී තිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

නව ගොඩනැගිල්ලේ සැලැස්ම සකස් කිරීම සඳහා 2009 වර්ෂයේදී අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු.227,370 ක් පාලක මණ්ඩල අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී වියදමක් ලෙස කපාහැර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,137,956 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,675,037 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.462,919 ක වර්ධනයක් ඇතිවී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම රු.1,022,855 කින් වැඩිවී තිබුණද ආදායම රු.1,485,774 කින් වැඩිවී තිබීම ඉහත වර්ධනයට හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂවල මුල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අඛණ්ඩව මුල්‍ය අතිරික්තයේ වර්ධනයක් පැවති නමුත් 2014 වර්ෂයේ අතිරික්තයේ අඩුවීමක්ද, 2015 වර්ෂයේ නැවත අතිරික්තයේ වැඩිවීමක්ද පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී ආයතනයේ දායකත්වය 2011 සිට 2013 දක්වා වර්ධනය වී තිබුණද 2013 සිට 2015 දක්වා පිළිවෙලින් රු. 12,488,771ක්, රු. 10,961,081 ක් හා රු.11,717,050 ක් වූයෙන් 2013 වර්ෂයේ සිට එය උච්චාවචනය වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1984 අංක 28 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනත අනුව ආයතනයේ අරමුණු පහත පරිදි විය.

(අ) මුද්‍රණ ක්ෂේත්‍රයෙහි දැනට සේවා නියුක්ත තැනැත්තන් පුහුණු කිරීම හා සහනික ප්‍රදානය, මුද්‍රණ තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම.

(ආ) නව විෂය මාලා, ශිල්පී ක්‍රම කාර්යාවලි පිළිබඳ වාර ප්‍රවෘත්ති පත්‍රිකා හෝ වෙනත් ප්‍රකාශන නිකුත් කිරීම.

(ඇ) මුද්‍රණ කර්මාන්තයට සම්බන්ධ වෘත්තීය ප්‍රදර්ශනවලට සහභාගී වීම, එතෙර පුහුණුවීම් සමාරම්භ කිරීම හා හුවමාරු ක්‍රමයක් මත අන්‍යෝන්‍ය පුහුණුව ලබාදීම හා ලබා ගැනීම.

ඉහත අරමුණු අතුරින් මුද්‍රණ ක්ෂේත්‍රයෙහි දැනට සේවා නියුක්ත තැනැත්තන් හා ආධුනිකයන් පුහුණු කිරීම හා සහනික ප්‍රදානය, මුද්‍රණ තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය කිරීමේ අරමුණ ඉටුකර ගැනීම කෙරෙහි පමණක් අවධානය යොමුකර තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සඳහා ආයතන කාර්යය පරිපාටිය හා මුල්‍ය කාර්යය පරිපාටිය රු.56,725 ක් වැය කර 2009 වර්ෂයේදී පිළියෙල කර අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද 2016 අප්‍රේල් වන විටද අනුමැතිය ලබා දී නොතිබුණි.

(ආ) 2014 හා 2015 වර්ෂවල ආයතනය විසින් පාඨමාලා ගාස්තු සංශෝධනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

4.3 අරමුදල් ඌන උපයෝජනය

2015 දෙසැම්බර් 31 දිනට ආයතනය විසින් උපයනු ලබන ආදායම් රු.62,923,559 ක් ආයතනයේ අරමුණු ලභා කර ගැනීමට භාවිතා කිරීමකින් තොරව ආයෝජනය කර තිබුණි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 13 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 11ක් වූයෙන් පුරප්පාඩු 02 ක් පැවතුණි. සමාලෝචිත වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරු සහ උපදේශකවරු 32 දෙනෙකු පුහුණු කටයුතු සඳහා සේවයේ යොදවාගෙන තිබූ අතර ඒ සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

සංයුක්ත සැලැස්මේ ඇතුළත් නව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම, විදේශ සේවා නියුක්තිය සඳහා ජාත්‍යන්තර වෘත්තීය සුදුසුකම්වලින් හා බහු හැකියාවන්ගෙන් යුත් ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම හා ආයතනය සඳහා නව සංවිධාන සැලැස්මක් ස්ථාපිත කිරීම හා ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ලබා ගැනීම සඳහා වූ කාර්යයන් ඉටුකර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

ආයතනය පවත්වන පාඨමාලාවලට අදාළව බඳවාගැනීම්, පාඨමාලා හැරයාම් සහ පාඨමාලා සම්පූර්ණ කිරීම් පිළිබඳ විස්තර පමණක් ඇතුළත් සැලැස්මක් සකස්කර තිබුණද එකී සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක PFD/RED/01/04/2014/01 ප්‍රකාරව ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට අදාළ ප්‍රගතිය දැක්වෙන පරිදි පිළියෙල කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

2011 දෙසැම්බර් 23 දිනැති අංක DMA/06 දරන කළමණාකරණ විගණන චක්‍රලේඛය පරිදි ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සහ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාවේ යොදවන බවට තහවුරුකර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

5.4 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සියයට 20 සිට සියයට 446 දක්වා විචලනයන් වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරන පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ආදායම් පාලනය	පාඨමාලා ගාස්තු සංශෝධනය කිරීම සඳහා ක්‍රම වේදයක් නොතිබීම හා අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර නොගැනීම.
(ආ) ණයගැති පාලනය	බොල්ණය වෙන් කිරීමේ විධිමත් ක්‍රම වේදයක් නොතිබීම.
(ඇ) වියදම් පාලනය	ආයතනය පවත්වා ගැනීමට අදාල වියදම් හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් නොතබුණි.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

SRI LANKA INSTITUTE OF PRINTING

Ministry of Skills Development and Vocational Training

The pioneer professional body committed to the advancement of knowledge, skills and expertise in the Print & Digital Media Industry

එස්.රණතුංග
සහකාර විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
නො.306/72
පොල්දූව පාර
බත්තරමුල්ල

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ඉහත දක්වා ඇති යටෝක්ත වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් අපගේ අදහස් හා තොරතුරු මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.ඒ.ඒ.පී.ෆොන්සේකා
සභාපති - ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
රජයේ මුද්‍රණාලාධිපති
01.06.2016

Ex Officio Members
Government Printer
Chairman: State Printing Corporation
President: Sri Lanka Association of Printers
President: Sri Lanka Institute of Packaging

118, Dr. Danister de Silva Mawatha, Colombo 08, Sri Lanka
Phone: (+94) 11 2686162, (+94) 11 2679791 Fax: (+94) 11 2686162
e-mail: sliopreg@sltnet.lk Web: www.sliop.edu.lk

2.2.1 සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව ආයතනය විසින් හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනයක් මේ සමඟ අමුණා එවා ඇත.

(ආ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ආරම්භයේ සිට වර්තමාන තත්ත්වය දක්වා මුද්‍රණ ආයතනය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල රජයේ මුද්‍රණාලය සතුව පවතී. තවද ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ආරම්භයේ සිට වර්තමානය දක්වා සියලුම යටිතල පහසුකම් රජයේ මුද්‍රණාලයෙන් දරනු ලැබේ. එනම් ගොඩනැගිල්ලට අමතරව ජල හා විදුලි ගාස්තු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව දරනු ලැබේ. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මූලික පරමාර්ථය වනුයේ මුද්‍රණ ක්ෂේත්‍රයට අතුලුවන නවකයින් පුහුණු කිරීම හා දැනට මුද්‍රණ ක්ෂේත්‍රයේ සේවයේ නියුතු වූවන් හට තව දුරටත් පුලුල් දැනුමක් ලබා දීම වේ.

එබැවින් රජයේ මුද්‍රණාලයෙන් අප ආයතනය පවත්වාගෙනයාම සඳහා දෙනු ලබන සහයෝගය මත රජයේ මුද්‍රණ දෙපාර්තමේතුවේ සේවයේ නියුතු සේවකයන් පුහුණු පාඨමාලවන් සඳහා ඇතුලත් කිරීමත් ආරම්භයේ සිටම සිදුවන සේවා හුවමාරුවකි. ඉදිරියේදී ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට නව ගොඩනැගිල්ල ලබාදුන් පසු මෙම තත්වය වෙනස්කළ හැක. දැනට රජයේ මුද්‍රණාලයට ලබාදෙන ශිෂ්‍යත්ව සඳහා යන වියදම පාඨමාලා ආදයම ලෙස හා එම පාඨමාලාවල ගාස්තුව ජලය/විදුලි ගාස්තු වියදම ලෙස හර කරනු ලැබේ.

(ඇ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පවරාදී ඇති මෙම ඉඩම් සම්බන්ධයෙන් දැනට පවතින තත්ත්වය අනුව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට අදාල ඉඩම ඇතුළුව රජයේ මුද්‍රණාලය යටතේ ඇති මුළු ඉඩම් පරිශ්‍රයද මෙගා පොලිස් අමාත්‍යාංශයට පවරා ගැනීමට කටයුතු කරන ලද බව දන්වා ඇති නිසා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සතුව ඇති මෙම ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල වත්කමක් ලෙස සටහන් කිරීමට නොහැකි තත්ත්වයක් උද්‍ වී ඇත.

2.2.2 සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ඇති ගනුදෙනු හෙලිදරව් නොකිරීම

රජයේ මුද්‍රණාලයේ නිලධාරීන්හට නොමිලේ පුහුණු කිරීම ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ආරම්භයේ සිට මේ දක්වාම ගිවිසුමකින් තොරව සිදුවන ක්‍රියාවලියකි. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ආරම්භයේ සිට මේ දක්වාම රජයේ මුද්‍රණාලයාධිපති තනතුර දරණ පුද්ගලයින් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ද සභාපතිවරයා ලෙස ක්‍රියාකර ඇති අතර රජයේ මුද්‍රණාලයේ සේවකයින් හට මෙම නොමිලේ පුහුණුව ලබාදීම සඳහා තෝරාගනු ලබන්නේ රජයේ මුද්‍රණාලයේ නියෝජ්‍ය මුද්‍රණාලයාධිපතිය. ඔවුන් ඒ සඳහා එම නිලධාරීන්ගේ පුහුණුව සඳහා ඇති අදාලත්වය, සේවාකාලය, අදාල අංශය වෙත ඇති ප්‍රයෝජන ඇතුලුව කරුණු කිහිපයක් පදනම් කරගෙන තෝරා පත්කර එම නිලධාරීන් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ නොමිලේ පුහුණු පාඨමාලාවක් සඳහා විශේෂ අයදුම් පත්‍රයකින් අදාල මුද්‍රණාලයාධිපතිගේ අනුමැතිය මත එවනු ලබන අතර මෙම එවනු ලබන නිලධාරීන් හට මෙම ශිෂ්‍යත්ව ලබාදීමට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය කටයුතු කර ඇත.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

2009 වසරේ නව ගොඩනැගිල්ලේ සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් දරන ලද රු. 227,370/ ක මුදල සමාලෝචන වර්ෂයේ වියදමක් ලෙස කපාහරින ලද්දේ මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ පවතින ප්‍රමාදයත් සැලකිල්ලට ගෙන මෙම වියදම වර්ෂ කිහිපයක් ඉදිරියට ගෙනා ශේෂයක් ලෙස ගිණුම් ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම අනවශ්‍ය වූ බැවිනි.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය එහි මූල්‍ය වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම කරනු ලබන්නේ සුළු හා මධ්‍ය පරිමාන ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිතීන් (SCFRS for SMES) අනුව බව එම වාර්තාවල 1.2.1. (a) ඡේදයේ පැහැදිලිව දක්වා ඇති අතර ඉහත ප්‍රමිතීන් 11 හා 12 වන ඡේදයන් අනුව කෙටිකාලීන ආයෝජන මූල්‍ය උපකරණ (Financial Instruments) ලෙස වර්ගීකලයුතු අතර එම ආයෝජන සඳහා සමුච්චිත වන පොලී

ආදයම් එම ආයෝජනයට එකතුකර මූල්‍ය වාර්තාවල ඉදිරිපත් කලයුතු බව ඉහත ප්‍රමිතීන්හි 11/5(C) ඡේදයේ ඉතා පැහැදිලිව දක්වා ඇත. ඒ අනුව ලැබිය යුතු රු. 2,475,949 ක් වූ ආයෝජන ආදයම් ආයෝජන ලෙස ගිණුම්වල දක්වා ඇත.

(ආ) ණයගැති ශේෂය පසුගිය මූල්‍ය වාර්තා වලට අනුව

	2012	2013	2014	2015
ණයගැති ශේෂය				
ප්‍රධාන කාර්යාලය	1,867,100/	3,322,490/	4,232,349.50	6,676,874,50
මාතලේ ශාඛාව	229,750/	276,750/	379,750/	362,700/00
	2,096,850/	3,599,240/	4,612,099.50	7,039,574.50
බොල්ණය				
ප්‍රධාන කාර්යාලය	639,250/	944,050/	1,580,450/	2,656,024.50
මාතලේ ශාඛාව	-	-	165,000/	181,450/
	639,250/	944,050/	1,745,450/	2,837,470/
බොල්ණය වෙන් කිරීමේ ප්‍රතිශතය	30%	26%	37%	40%

2015/12/31 වන විට මෙම ශේෂයන් පහත ආකාරයට විග්‍රහ කළ හැක.

	2012	2013	2014	2015	ඉදිරියට ගෙනා ශේෂය 2015/12/31
ණයගැති ශේෂය					
ප්‍රධාන කාර්යාලය	731,850/	848,600/	1,075,574.50	4,020,850.00	6,676,874.50
මාතලේ ශාඛාව	101,250/	47,250/	32,950/	181,250.00	362,700.00
	833,100/	895,850/	1,108,524.50	1,202,100/	7,039,574.50
බොල්ණය					
					ඉදිරියට ගෙනා මුළු ශේෂය
ප්‍රධාන කාර්යාලය	731,850/	848,600/	1,075,574.50	-	2,656,024.50
මාතලේ ශාඛාව	101,250-/	47,250/-	32,950/	-	181,450/
	833,100/	895,850/	1,108,524.50	-	2,837,747.50

ඉහත පෙන්වා දී ඇති වගුවට අනුව අපගේ බොල්ණය වෙන්කිරීම වර්ෂ 4ක එනම් 2012/2013/2014/2015 යන සියලුම වර්ෂ සඳහා 40% කි. මේ අනුව සලකා බැලිමේදී වර්ෂ කිහිපයකට බොල්ණය වෙන්කිරීම් 40% ප්‍රතිශතයකට සීමා කිරීම විශාල අගයක් නොවන බව අපගේ හැඟීමයි. තවද 2015 වර්ෂය තුල බඳවාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ප්‍රමාණය වැඩිවීමද 2015 වර්ෂයේ ණයගැති ශේෂය වැඩිවීමට බලපා ඇත. තවද හිඟ පාඨමාලා මුදල් ගෙවිය යුතු සමහර ශිෂ්‍ය ශිෂ්‍යාවන් පාඨමාලාවන් පවත්වාගෙන යන අතර තුර පාඨමාලා හැරදමා ගොස් අති නිසා එම ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගෙන් මුදල් අයකරගත නොහැකි තත්ත්වයන් උද්ගත වී ඇත. අද වෙළඳපල පවතින තරඟකාරී තත්ත්වයන් මත මෙම ක්ෂේත්‍රයන්ට සම්බන්ධ අනිකුත් ආයතනයන් පාඨමාලා ගාස්තු කොටස් වශයෙන් ගෙවීමේ පහසුකම් ලබා දී ඇත. එමනිසා අද පවතින වෙළඳපොළ

පවතින තරඟකාරීත්වය මත අපට එක්වර පාඨමාලාව ආරම්භයේ මුලු මුදලම අයකර ගත හොත් අප ආයතනයට ඇතුල්වන සිසුන් සංඛ්‍යාව යම් අඩුවීමක් සිදුවිය හැක. එබැවින් පාඨමාලාවන් සඳහා වාරික මුදල් කොටස් 2ක් හෝ 3ක් වශයෙන් ගෙවීමට ඉඩදී ඇත.

බොල්ණය වෙන්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම නොහැකි වූයේ 29/02/2016 දිනට පෙර අවසන් ගිණුම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු අතර පාලක මණ්ඩල රැස්වීමද එම මාසය තුල නොපැවැත්වුනු නිසාය. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට නොහැකි විය. ඉදිරියේදී පවත්වනු ලබන පාලක මණ්ඩල රැස්වීමකදී මේ සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.

2.2.5 නීති රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

(ආ) 2015 වර්ෂයේදී පාලක මණ්ඩල රැස්වීම් 01ක් පමණක් පැවත්වීමට සිදුවුයේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට නව අධ්‍යක්ෂක මණ්ඩලයක් පත් කිරීමට සිදුවූ ප්‍රමාදයන් නිසාය.

(ආ) (i) ඉදිරියේදී බංකු සැසඳුම් වාර්තා සකස්කර ඊළඟ මාසයේ 15 වැනිදට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ

(ii) 2015 වර්ෂයට අදල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර අවසන් කර අත.

2003 ජුනි 02 දිනැති අංක පීඊටී/12 දරණ ව්‍යාපාර චක්‍රලේඛය

(i) 6.5.1 වගන්තිය

සෑම ගිණුම් වර්ෂයක් අවසානයේදී එනම් ඊළඟ වර්ෂයේ පෙබරවාරි 28 වන දිට පෙර ගිණුම් වර්තා විගණකාධිපති දෙපාර්තමේන්තුවට යොමු කළයුතු බැවින් එම ගිණුම් වාර්තාව ඉදිරිපත් කිරීමේ කටයුතු කඩිනමින් සිදුකරන ලද අතර වාර්ෂික වාර්තාව රජයේ විගණකාධිපති වාර්තාව ලැබීමෙන් අනතුරුව සකසා ඉදිරිපත් කරනු ලැබේ.

(ii) **8.2.2 වගන්තිය**

ආයෝජනය සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ඇත.

(ඈ) 2008 ජනවාරි 21 දිනැති අංක 1503/3 දරන ඇති විශේෂ ගැසට් නිවේදනය-
වටිනාකම රු.25,000කට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තුවක් අය කරන අතර අතපසු වීමකින් සමහර අවස්ථා මගහැරී ගොස් ඇත. ඉදිරියේදී එසේ නොවීමට වග බලාගනු ලැබේ.

(ඉ) 2011 පෙබරවාරි 23 දිනැති අංක DMS/E4/37/7/235/2 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ 7 ඡේදය:-
බඳවා ගැනීමේ පටිපාටි අනුමත වී ඇත.

4. මෙහෙයුම් සමාලෝචනය

(ආ) (1) නව ගොඩනැගිලි සංකීර්ණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රජයෙන් ලබා දෙන බවට අප අමාත්‍යාංශය දැනුම් දී ඇත. ප්‍රතිපාදන ලද වහාම ගොඩනැගිලි ඉදිකිරීම කටයුතු ආරම්භ කෙරේ.

(ii) කාර්යස්ථ පුහුණු කටයුතු සඳහා 2014 වර්ෂය තුල රු. 33,500/ද 2015 වර්ෂය තුල රු. 107,200/ වියදම් කර ඇත. කාර්යස්ථ පුහුණු කටයුතු සිදු කරන්නේ අවශ්‍යතාවය මත අනුව පමණකි.

(iii) 2014 දී ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු NVQ Level 3 පාඨමාලාවද 2015 දී ග්‍රැෆික්ස් නිර්මාණයකරු NVQ Level 4 පාඨමාලාවද ආරම්භ කරන ලදී.

(iv) සෑම වසරකම මෙරට මෙන්ම විදේශ සේවා නියුක්තිය සඳහාද ජාත්‍යන්තර වෘත්තීය සුදුසුකම් වලින් හා බහු හැකියාවන්ගෙන් යුත් ශ්‍රමබලකායක් සෑම වසරකට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය බිහි කරයි. නව තාක්ෂණයට අදලව පාඨමාලා සංවර්ධනය කිරීම සම්මන්ත්‍රණ වැඩ මුළු පැවැත්වීම තුලින් නව තාක්ෂණයට පුහුණු කිරීම මේවා අතර වේ.

පසුගිය වසර 4 තුල පහත සඳහන් ප්‍රමාණයක් ශ්‍රමිකයන් පුහුණු කර මෙරටට දායාද කර ඇත.

2012 - 871
2013 - 886
2014 - 942
2015 - 885

(iv) මේ සම්බන්ධව ගරු අමාත්‍යතුමා සමඟ සාකච්ඡා පවත්වා ඇත.

(ඇ) අප ආයතනය විසින් කාර්ය සාධන වාර්තාවක් සකස් කොට අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. මෙම වාර්තාව අමාත්‍යාංශය විසින් මුද්‍රණය කරන ලද අමාත්‍යාංශය කාරක සාධන වාර්තා ඇතුලත් පොතේ මුද්‍රණය වී ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට අදල වන්නේ ප්‍රධාන වශයෙන්ම ඇතුල්වන ශිෂ්‍ය සංඛ්‍යාව පමණි. අප ආයතනයේ පාරිභෝගිකයා වන්නේ ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ය. ඔවුන්ගේ ඇතුලත්වීමේ ප්‍රතිශතය අනුව අප ආයතනයේ සාර්ථකත්වය ඉදිරි ගමන නිර්මාණය කෙරේ. අප ආයතනය සවයං උත්පාදන ආයතනයක් නිසා වැඩි සැලකිල්ල යොමු කළ යුත්තෙ ආදයම මතය. අනවශ්‍ය කරුණු හඹා යෑමෙන් සිදුවන්නේ ආයතනයට හානියක් මිස ලාභයක් නොවේ. ඉලක්ක ගත ශිෂ්‍ය සංඛ්‍යාව සහ ආදයම කෙරේ වැඩි ප්‍රවනතාවයක් දැක්වීම මෙහිදී සිදුවේ.

(ඈ) (i) අප ආයතනයේ පාඨමාලා සියල්ල සකසා ඇත්තේ කෙෂ්ත්‍රයේ අවශ්‍යතාවයන්ට අනුවය. එම පාඨමාලා අතරින් TVEC ආයතනයෙන් NVQ මට්ටමට සාදා ඇත්තේ පහත සඳහන් පාඨමාලා වලට පමණි.

1. ග්‍රැෆික් ඩිසයිනර්
2. ඕෆ්සෙට් යන්ත්‍ර ක්‍රියාකරු
3. පොත් බැඳුම්කරු

මෙයින් ග්‍රැෆික් ඩිසයින් සහ ඕෆ්සෙට් යන්ත්‍ර ක්‍රියාකාරු සඳහා NVQ පාඨමාලා අප ආයතනය ආරම්භ කර ඇත.

(ii) සමස්ථ ප්‍රතිශතයක් ලෙස ගත්කළ පාඨමාලාව හැරයාමේ ප්‍රතිශතය 14% ක් පමණ වේ. අප ආයතනයේ සමහර පාඨමාලාවලට සිසුන් 10-15ක් අතර ප්‍රමාණයක් බඳවා ගන්නා ලද අවස්ථා ඇත. මෙවන් අවස්ථාවල ළමුන් 5-6 දෙනෙකු පාඨමාලාව හැර ගියොත් එම පාඨමාලාවේ සිසුන් හැරයාමේ ප්‍රතිශතය 50% සිට 60% දක්වා වෙනස් වේ. මෙම හේතුව නොවැළැක්විය හැකි කරුණකි. සිසුන් පාඨමාලා හැර යාමට පහත සඳහන් කරුණු බලපානු ඇත.

- පාඨමාලා ගාස්තු ගෙවීමේදී මුලු ගාස්තුවෙන් අඩක් පාඨමාලාව ආරම්භයට ප්‍රථම ගෙවන අතර ඉතිරි කොටස පාඨමාලාව පවත්වාගෙන යන අතර මගදී නොගෙවන නිසා එම සිසුන්ගේ පන්ති නතර කිරීමට සිදුවීම.
- මූලික දැනුම මදිකම නිසා පන්ති හැරයාම.
- ආයතනය තුල පවතින යටිතල පහසුකම්වල තිබෙන නොයෙකුත් අඩුපාඩු.
- පංතිකාමර වල තිබෙන සීමිත ඉඩ පහසුකම්
- දියුණුවන තාක්ෂණයට අදාල යන්ත්‍ර උපකරණ වල හිඟකම.

තවද ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙසේ ලාබ ලබමින පවාත්ගෙන යනු ලබන්නේ නොයෙකුත් අඩු පාඩු සහ දුෂ්කරතා මධ්‍යයේ බව මෙහිලා දන්වමි.

මේ සම්බන්ධව අමාත්‍යාංශය සහ අමාත්‍යවරයා සමඟ සාකච්ඡා පවත්වා ඇති අතර ඒ අනුව නවගොඩනැගිල්ලක් ඉදිකර දෙනබව අමාත්‍යාංශය අපට දැනුම් දී ඇත. මේ සඳහා වෙන්වුනු ඉඩමක් රජයේ මුද්‍රණාල පරිශ්‍රයේ අප සතුව ඇත.

(iii) ලබා ගැනීමට අපේක්ෂිත ආදයම බජට් එකේ සඳහන් කර ඇත.
(iv) වැඩිපුර ආධුනිකයන් බඳවා ගැනීම නිරන්තරයෙන්ම සිදුවේ. ඒ සෑම වාරයකම ක්‍රියාකාරී සැලැස්ම වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් නොපෙනේ.

(ඉ) පාලක මණ්ඩල එකක් පමණක් පැවැත්වූයේ නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කිරීමට අමාත්‍යාංශයේත් සිදුවූ ප්‍රමාදය නිසාය.

(ඊ) මෙම කර්තව්‍යය අපට තිනවම සිදු කළ නොහැක. මේ සම්බන්ධ ශ්‍රී ලංකා මුද්‍රණ කරුවන්ගේ සංගමය සහ අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ සාකච්ඡා පවත්වා ඇත. ඉදිරියේදී ඒ සඳහා පියවර ගැනීමට බලාපොරොත්තු වේ.

(උ) මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන රජයෙන් ලබා දීමට අමාත්‍යාංශය මැදිහත් ව කටයුතු කරයි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සඳහා ආයතන කාර්යය පටිපාටියක් හා මූල්‍ය කාර්ය පටිපාටියක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැති ලබාගෙන නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට යොමුකර ඇති අතර අමාත්‍යාංශය මගින් ඒ සඳහා කමිටුවක් පත්කර ඇති අතර තවම ඒ සම්බන්ධව තීරණයක් ගෙන නැත.

(ආ) බස්නාහිර පලාත් දියුණු කිරීමේ ක්‍රියාවලිය යටතේ මෙගාපොලිස් අමාත්‍යාංශයට මුද්‍රණ ආයතනය සතුව ඇති ඉඩම ඇතුලවරජයේ මුද්‍රණාල පරිශ්‍රයේ පවරාගැනීමට සැලසුම්කර ඇති බැවින් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධව කටයුතු පසුවට කල් දැමීමට සිදු වී ඇත.

(ඇ) 2015/12/31 දින වන විට මුදල් පොතට අනුව ශේෂය

ගිණුම් අංක 078-1-001-1-2268060	2,148,875/44
ගිණුම් අංක 078-1-001-8-2268052	441,372/91
මුළු ශේෂය	2,590,248/35

ආයතනයේ පරිපාලන කටයුතු වෙනුවෙන් මාසික රු. 1,500,000 ක් පමණ වැය වේ. එබැවින් අපගේ බැංකු ගිණුමේ ශේෂය මාසිකව රු. 2,000,000/ ක් පමණ රඳවා ගැනීමට සිදුවේ. එබැවින් අපට එම මුදල් ආයෝජනය සඳහා යෙදවිය නොහැක. බැංකු ගිණුමේ ශේෂයන් වැඩි වූ විට එම මුදල් ආයෝජනය කර ඇත. ඒ අනුව 2015 වර්ෂයේ රුපියල් මිලියන 3ක් රාජ්‍ය බැංකුවක ස්ථිර තැන්පතුක යොදවන ලදී. (ඉහත පෙන්වා දී ඇති ශේෂයන් අප ගිණුම් වාර්තාවේ ඉදිරිපත් කොට ඇත)

4.3 සේවක මණ්ඩල කළමනාකරණය

(අ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සවයං උත්පාදන ආයතනයක් වන බැවින් සේවක චේතනය හා අනිකුත් සියළුම පාරිශ්‍රමිකයන් ආයතනය විසින් දැරිය යුතු බැවින් ඉතාමත්ම සීමිත සේවක මණ්ඩලයකින් ආයතනය පවත්වාගෙන යනු ලැබේ. විශේෂයෙන්ම උපදේශකවරු ස්ථිර සේවයට බඳවා ගැනීමේදී කරුණු කිහිපයක්ම අවධානය ට යොමු කළ යුතුව ඇත. මන්ද සමහර පාඨමාලාවන් වසරකට කිහිපයක් පමණ පවත්වන බැවින් එම අවස්ථාවලදී පමණක් බාහිර උපදේශක වරයන්ගේ සේවය ලබාගෙන අධ්‍යයන කටයුතු සිදුකරනු ලබන අතර, එසේ නොමැතිව ස්ථිර උපදේශකයන් බඳවා ගත හොත් පාඨමාලාව නොපැවැත්වුවත් එම උපදේශකයන් හට මාසික චේතනයක් ගෙවිය යුතු වේ. තවද ස්ථිර උපදේශකවරයෙකුට වැටුප හා සියළුම දීමනාවන් ලබාදීමේදී ඒ සඳහා යන පිරිවැය වැඩිවන අතර බාහිර උපදේශකවරයෙකුට යන වියදම ඊට සාපේක්ෂව අවම මට්ටමක පවතී. එබැවින් මෙම කරුණු ගැන අවධානය යොමුකොට නව උපදේශකවරුන් බඳවා ගැනීම සඳහා තීරණය කරනු ලැබේ. තවද බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමේදී ඉහත කරුණු බලපානු ලැබේ. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ස්ථිර කථිකාචාර්යවරු බඳවා ගතහොත් ඉතා විශාල පිරිවැයක් දැරීමට සිදුවන අතර මෙම ක්ෂේත්‍රයට පරිනත දැනුමෙන් පරිපූර්ණ වූ පුද්ගලයන් හිඟවීම මත හා එවැනි පුද්ගලයන් ස්ථිර සේවයට බඳවා ගැනීමට සිදුවුවහොත් විශාල චේතනයක් ගෙවීමට සිදුවනු ඇත. එසේ වුවහොත් පාඨමාලා ගාස්තු වැඩි කිරීමට හෝ එම පාඨමාලා ගාස්තු වලින් කථිකාචාර්යවරුන්ගේ චේතනය ආවරණය කිරීමට නොහැකිවනු ඇත.

මෙම හේතූන් මත අපගේ පාඨමාලාවන් වල අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍යතාවයන් පරිදි පමණක් මෙම බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. එබැවින් අදාල අංශයන්ට දැනුමෙන් පරිපූර්ණ කථිකාචාර්යවරු අවශ්‍ය අවස්ථාවන් වලදී පමණක් සේවයට යොදවන බැවින් එම කථිකාචාර්යවරු නිශ්චිත සංඛ්‍යාවක් වෙන් කොට තබාගත නොහැක.

(ආ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ බඳවා ගැනීමේ පරිපාටිය (SOR) කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඇත.

(ඇ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සවයං උත්පාදන ආයතනයක් බැවින් ඉතාමත්ම සීමිත හා වඩා කාර්‍යක්ෂම සේවක මණ්ඩලයකින් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කටයුතු කර ඇත. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ සේවක මණ්ඩලය තීරණය කිරීමේදී වැඩි අවධානයක් යොමුකොට ඇත්තේ රාජ්‍ය ආයතනවල ක්‍රමවේදයන්ට වඩා පෞද්ගලික ආයතනයන්හි ක්‍රමවේදයන්ය. මන්ද පෞද්ගලික ආයතනවලද අවශ්‍යතාවයන් පරිදි සේවක මණ්ඩලයක් බඳවා ගෙන වඩා ලාභදායක හා වඩා ඵලදායක අයුරින් එම ආයතනවල අරමුණු කරා ලඟා වේ. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ දැනට සීමිත සේවක සංඛ්‍යාවෙන් උපරිම සේවයක් ලබන ආකාරයට මෙම මානව සම්පත් යොදවා ඇති අතර ඉදිරියේදී ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට නව ගොඩනැගිල්ලකට පිවිසුන පසු ආයතනයේ අවශ්‍යතාවන් වලට ගැලපෙන පරිදි නව සේවක මණ්ඩලයක් බඳවා ගෙන වඩා හොඳ කාර්‍යක්ෂම හා ඵලදායක සේවයක් ලබා දීම තුළින් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ අරමුණු කරා ලඟා වීම අපගේ මූලික අරමුණවේ.

4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

(අ) පාඨමාලා ගාස්තු තීරණය කිරීම හා අඩු නිතයන්ගේ පොදු පහසුකම් වැඩි දියුණු කිරීම.

(1) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා ගාස්තුව මෙම ක්ෂේත්‍රයට සම්බන්ධව අනෙකුත් තරඟකාරී ආයතන සමඟ සැසඳීමේදී අවම මට්ටමක පවතින අතර ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සවයං උත්පාදන ආයතනයක් වන බැවින් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ රඳා පැවැත්ම තීරණය කරනු ලබන්නෙ පාඨමාලා තුලින් උපයන ආදායම මතය. මෙම ආදායම ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලාවන් සඳහා ඇතුල් වන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් මත

තීරණය වේ. තවද සමහරක් පාඨමාලාවන් ලාභ ඉපයීමේ පරමාර්තයෙන් තොරව මුද්‍රණ ක්ෂේත්‍රයට සෙවය කිරීමේ අභිප්‍රායෙන් පවත්වා ගෙන යනු ලැබේ. මුද්‍රණ ක්ෂේත්‍රයන්ට පිවිසෙන්නේ අප රටේ මධ්‍යම හා අඩු ආදායම් ලබන පවුල් වලින් නිසා ඉතා සාධාරණ අඩු පාඨමාලා ගාස්තු යටතේ මුද්‍රණ පාඨමාලා පවත්වා ගෙන යා යුතුව ඇත. තවද ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ උසස් තාක්ෂණ ඩිප්ලෝමාව පදනම් කර කරගෙන පවත්වා ගෙන යා යුතු පාඨමාලාවන්ද මේ අතර වේ. එබැන් එම පාඨමාලාවන් සඳහා පාඨමාලා ගාස්තු ඉහළ දැමීමෙන් මෙයට ඇතුල් වන ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගේ යම් අඩුවීමක් සිදු විය හැක. එබැවින් පරිගණක ක්ෂේත්‍රයට අදාල පාඨමාලාවන් සඳහා පමණක් වැඩි වශයෙන් පාඨමාලා ගාස්තු සංශෝධනය කරන අතර මේ තුලින් උපයන ආදායමෙන් ලාභ පරමාර්ථයෙන් තොරව පවත්වාගෙන යන පාඨමාලාවන්ගේ වියදම් ආවරණය කරනු ලැබේ. තවද පාඨමාලාවන් සඳහා ඇතුලත් වන සමහර ශිෂ්‍ය/ශිෂ්‍යාවන් පාඨමාලාව කරගෙන යන අතරතුර පාඨමාලාවන් හැරදමා යන අවස්ථාවන් ඇති බැවින් ආයතනයේ යම් අලාභ දයක තත්වයන්ටද මුහුණදීමට සිදු වී ඇත. එබැවින් මෙම කරුණු සියල්ලම සැලකිල්ලට ගෙන පාඨමාලා ගාස්තු සංශෝධනය සිදු කරනු ලැබේ.

(ii) ඉහත පෙන්වා දී ඇති කරුණු වලට අමතරව රජයෙන් ලබාදුන් සේවක පඩි වැඩිවීම ලබාදීම සැලකිල්ලට ගෙන මෙම තීරණය ක්‍රියාත්මක කොට ඇත.

(iii) දැනට ශ්‍රී ලංකා මුද්‍රන ආතනය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිල්ලකි. එබැවින් මෙම ගොඩනැගිල්ල තුල අවම ඉඩකඩක් සහ අවම සනීපාරක්ෂක පහසුකම් වලින් ආයතනය පවත්වාගෙන යාමට සිදුවී ඇත. මන්ද රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව සතුව ඇති මෙම ගොඩනැගිල්ල ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට අවශ්‍ය පරිදි වෙනස් කිරීමට හෝ වැඩිදියුණු කිරීම් සිදුකල නොහැක. අපගේ අවශ්‍යතාවය ද වන්නේ ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලාවන් හදරන ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට වඩා හොඳ සේවාවන් සැපයීමටය. එබැවින් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට නව ගොඩනැගිල්ලක අවශ්‍යතාවය වසර කීපයක සිට පැවතුණද අද වන විට ද මෙම ප්‍රශ්ණය නිරාකරණය වී නොමැත. එබැවින් ඉදිරියේදීවත් නව තාක්ෂණයෙන් හා පහසුකම් වලින් සපිරි නව ගොඩනැගිල්ලක් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට ලබාදීම කාලීන අවශ්‍යයතාවයකි.

(ආ) ශ්‍රීලංකා මුද්‍රණ ආයතනයේ ලේඛකාධිකාරි, පාඨමාලා අධ්‍යක්ෂ හා අලෙවි විධායකවරයාට ලබා දී ඇති ඉන්ධන දීමනාව සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. මේ සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනත යටතේ 1984 අංක 18 (1) ඇ වගන්තියට අනුකූල වන පරිදි ක්‍රියා කොට ඇත.

5.2 අයවැය පාලනය

අයවැය ලේඛනයේ ඇතුලත් ආදායම් සහ වියදම් අතර විචලනයක් ඇතිවීම නොවැළැක්විය හැකි කරුණක් වන නමුත් එම විචලනයන් අවම කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය රජයේ අරමුදල් ලබා නොගන්නා ආයතනයත් බැවින් අයවැය ගත වූ වියදම් සහ ආදායම් ඒ ආකාරයටම යොදා ගැනීම අපහසු වූ කාර්යයකි.

ආයතනික දියුණුව සඳහා ගන්නා ලද මධ්‍ය කාලීන ක්‍රියා මාර්ග

ආයතනයේ ඉලක්ක හා පරමාර්ථ කරා ළඟා වීම සඳහා පහත සඳහන් මාතෘකා ඔස්සේ ආයතනික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.

1. සේවා සැපයීමේ දියුණුව

1.1 පාඨමාලා

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය දැනට පවත්වා ගෙන යනු ලබන පාඨමාලා එලෙසින්ම පහත සඳහන් ප්‍රධාන මාතෘකා යටතේ පවත්වා ගෙන යෑම.



විවිධ වෘත්තීය මාර්ග ඔස්සේ මෙම පාඨමාලා සංවර්ධනය කර ඇත. සියලු පාඨමාලා වසර 3 ක්ට වරක් හෝ අවශ්‍ය අවස්ථාවලදී සංශෝධනය කරනු ලැබේ.

1.2 සම්මන්ත්‍රණ සහ වැඩමුළු

පාසැල් හැරගිය සිසුන් සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වා ඒ ආශ්‍රයෙන් ක්ෂේත්‍රයේ වෘත්තීය සංවර්ධනයට මාර්ගෝපදේශ සපයනු ලැබේ.

තාක්ෂණික වැඩමුළු පවත්වා ක්ෂේත්‍රයේ නියැලි සේවක මහතුන්ට නව තාක්ෂණය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දේ. මේ තුළින් ඔවුන් සතු කුසලතා සහ නුවණ වර්ධනය කෙරේ.

1.3 විශේෂ පුහුණු වැඩසටහන්

රජයේ සහ පෞද්ගලික ආයතන වල ඉල්ලීම අනුව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මුද්‍රණ ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයට අදාල පාඨමාලා අලලා විශේෂ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

1.4 මුද්‍රණ ක්ෂේත්‍රය නැංවීම

නව තාක්ෂණයට අනුව සීඝ්‍රයෙන් දියුණුවන මුද්‍රණ තාක්ෂණයට සරිලන ලෙස යන්ත්‍රෝපකරණ සහ මනුෂ්‍ය සම්පත් ප්‍රවර්ධනය කිරීම සහ ඊට අදාල පාඨමාලා සම්මන්ත්‍රණ, සංදර්ශන සහ වැඩමුළු වලට ආයතනය මෙන්ම සේවක මහතුන් ද සහභාගී කරවීම.

2. ආයතනික සේවාවන් ප්‍රසිද්ධ කිරීම සහ සංවර්ධනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ සේවාවන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලට දැනුවත් කිරීම සඳහා අලෙවි උපදේශකයෙකු පත් කිරීම.

ශ්‍රී ලංකාවේ මුද්‍රණ ආයතන සේවාවන් පිළිබඳ පුවත්පත් වාර්තා පල කිරීම සහ රූපවාහිනී ආයතනය සමඟ සාකච්ඡා පැවැත්වීම තුලින් දිවයිනේ සිසුන්ට ආයතනය පිළිබඳ දැනුවත් කිරීම. රජයේ ගැසට් නිවේදන ආධාරයෙන් පාඨමාලා ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම.

නව තාක්ෂණික පහසුකම් සහිත වෙබ් අඩවියක් නිර්මාණය කර ඒ හරහා තොරතුරු සැපයීම හා දත්ත ලබාගැනීම.

ආයතනික ප්‍රචාරණය උදෙසා facebook තාක්ෂණය යෙදවීම

ISO 9001 : 2008 ඵලදායී සහතිකය ලබා ගැනීම.

3. ආයතනික ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ආධාර ඇතිව බොරැල්ලේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට යාබදව පර්චස් 40ක ඉඩමක් අත්පත් කරගෙන ඇත. මෙම නව ගොඩනැගිල්ල ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ධාරිතාව වැඩි කිරීම සඳහා ආධාර වන අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වඩාත් හොඳපහසුකම් ලබාදීමටද අවස්ථාව උදා කර දේ. මෙම ඉදිකිරීම උදෙසා රජයෙන් ආධාර බලාපොරොත්තු වන අතර ඒ සඳහා අවශ්‍ය දත්ත සහ තොරතුරු අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.